චක්‍ර ලේඛ අංක - 11/2023

මගේ අංකය-සමු/මෙ/CCD/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප.)
තැ.පෙ.444,ආදිපාද වීදිය,
කොළඹ-01
2023.09. 15

ගරු සභාපතිවරුන් සහ කාරක සභා / අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත,
බස්නාහිර පළාත් සියළු සමුපකාර සමිති /සංගම්

**සමුපකාර සමිති / සංගම් වල සෑම මුදල් වර්ෂයකම , අයවැය පිළියෙල කිරීම, ගණුදෙනු ගිණුම් ගත කිරීම අවසන් ගිණුම් පිළියෙල කිරීම හා මූල්‍ය ප්‍රකාශන කට්ටල ඉදිරිපත් කිරීම.**

වර්තමානයේ ඇතැම් සමුපකාර සමිති /සංගම් විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල වසර ගණන් ප්‍රමාද වි විගණනය කිරිම සදහා මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රවනතාව සහ ඇතැම් සමුපකාර සමිති ගිණුම් ඉදිරිපත් කිරිම පැහැර හැරිම හා එම තත්වයන් දෛනිකව වැඩිවිම මත සමිතිවල එලදායිතාව පිළිබද ගැටළු , කළමණාකරන හා මූල්‍ය පාලන ගැටළු , මූල්‍ය වංචා, අක්‍රමිකතා, අවභාවිතා හා දූෂණ ඇතිවිමේ ඉඩ ප්‍රස්ථා ඇතිවිමේ අවස්ථාව අවධාන නිර්මාණය වී ඇති බව නිරික්ෂයණ වේ.

මීට අමතරව මෙම තත්වය හේතු කොටගෙන ආයතනික අඛණ්ඩ පැවැත්ම පිළිබද ගැටළු , සාමාජික හා සාමාජික නොවන තැන්පත්කරුවන්ගේ මුදල්වල සුරක්ෂිතතාව සහතික කිරිමේ ගැටළු මෙන්ම ආයතනික සහ සමිති අපකීර්තියට ලක්විම තත්වයක් නිර්මාණය වී ඇත.

මෙම පසුබිම තුල සමුපකාර සමිති වල විගණන ප්‍රමාදවීම හේතු කොටගෙන, දෙපාර්තමේන්තුව වෙත ඍජු හා වක්‍ර ලෙස පැමිණිලි හා දෝෂාරෝපණ ගලා ඒම නිරන්තරයෙන්ම සිදුවේ. එහෙත් ඉහත සදහන් කාරණා සම්බන්ධ ප්‍රධාන වගකීම නීත්‍යානුකූලව සමුපකාර ප්‍රඥප්තිය අනුව පැවරී ඇත්තේ සමිති කාරක සභා සහ අධ්‍යක්ෂක මණ්ඩල වෙතය.

එබැවින් සමුපකාර සමිති/ සංගම් වල කාරක සභා / අධ්‍යක්ෂක මණ්ඩල ඉහත සදහන් කල තම තමන්ගේ කාර්යභාරය නිසිපරිදි කලට වේලාවට සිය කාර්ය මණ්ඩලයන් ලවා සිදු කර නොගැනිම මතද විගණන කටයුතු ප්‍රමාද විමක් සිදුවී ඇත. එහෙයින් ඉහත කී කටයුතු වගකීම හා වගවීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහය, 2011 අංක 04 දරණ බස්නාහිර පළාත් සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තියේ පහත දැක්වෙන වගන්ති හා 1973 රීති මාලාවේ පහත දැක්වෙන විධිවිධාන කෙරෙහි ද ඔබගේ අවධානය යොමු කරවමි.

1. <u>දණ්ඩ නීති සංග්‍රහය 32 වගන්තිය</u>
   සියල්ලන්ගේ පොදු අදහස ඉෂ්ට කර ගැනිම් වශයෙන් කීප දෙනෙකු විසින් අපරාධයක් කළ කල්හි තමා විසින් එය තනිවම කරන ලද්දක් සේ , එකී තැනැත්තන්ගෙන් එක් එක්කෙනා ම එකී ක්‍රියාව සඳහා යටත් විය යුතුය.

2. <u>1998 අංක 03 දරණ බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 43 (අ) (1) සහ (2) වගන්තිය</u>
   43 (අ) (1) වගන්තිය- සෑම ලියාපදිංචි කළ සමිතියක්ම, සමිතියේ ආදායම සහ වියදම වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබදව නිසි ගිණුම් පවත්වා ගෙන යාමට සැළැස්විය යුතුය.

   43 (අ) (2) වගන්තිය- රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින් නියම කරනු ලබන පරිදි, සමිතියේ කටයුතු වලට අදාළ ගිණුම් හා සංඛ්‍යාන පිළිබද වාර්ෂික ප්‍රකාශයක් සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම සකස් කරනු ලැබිය යුතුය. ඒ ගිණුම් ප්‍රකාශය , එය අදාළ වන මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තා වෙත හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

3. 1998 අංක 03 දරණ බස්නාහිර පළාත් සමූපකාර සමිති ප්‍රඥප්තියේ 43 (ආ) (1) වගන්තිය

සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම, ආදායම් ඉලක්ක, පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් , මූල්‍ය සහ මුදල් ආයෝජන, අයවැය ගත කරන ලද ලාභාලාභ ගිණුම, ආදායම් සහ වියදම් ගිණුම් සහ ශේෂපත්‍ර දැක්වෙන අයවැය ලේඛණයක් සෑම මුදල් වර්ෂයක් වෙනුවෙන්ම පිළියෙල කරනු ලැබිය යුතුය.

මේ වගන්තියේ විධිවිධාන වලින් කිසිවක් අනුව කටයුතු කිරීම ලියාපදිංචි කල සමිතියක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක ඒ සමිති කාරක සභාවේ සෑම සාමාජිකයෙකුම/ අධ්‍යක්ෂක මණ්ඩල සෑම සාමාජිකයෙකුම වරදට වරදකරු වන අතර , මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගය කින් පසුව වරදකරුවකු කරනු ලැබූ විට රුපියල් දෙදහසකට නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතුය.

4. 1998 අංක 03 දරණ බස්නාහිර පළාත් සමූපකාර සමිති ප්‍රඥප්තියේ 44 (4) වගන්තිය

රෙජිස්ට්‍රාර්වරයාට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් තත් කාර්යය සඳහා සාමාන්‍ය හෝ විශේෂ නියමයක් මගින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට ලියාපදිංචි කළ සමිතියක් විසින් පවත්වාගෙන යනු ලබන සියළුම පොත් ,ලේඛණ, ගිණුම් සහ ලියවිලි, සුරැකුම්පත් සහ අතේ ඇති මුදල් සියළු අවස්ථාවලදි ලබාගැනීමට ද, පරීක්ෂා කිරීමට ද හිමිකම් තිබිය යුතුය. තව ද , ඉහත කී දේ භාරව සිටින හෝ පවත්වාගෙන යන හෝ සන්තකයෙහි ඇතිව සිටින සෑම තැනැත්තෙකුම ඒවා රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඒ බලය දෙන ලද තැනැත්තාට ඉදිරිපත් කළ යුතුය. නැතහොත් සමිතියේ ගණුදෙනු හා වැඩකටයුතු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා හෝ ඒ පරීක්ෂණය හෝ විගණනය කරන ඒ බලය දෙන ලද තැනැත්තා විසින් නියම කරනු ලබන තොරතුරු සැපයිය යුතුය.

5. 1998 අංක 03 දරණ බස්නාහිර පළාත් සමූපකාර සමිති ප්‍රඥප්තියේ 66 (1) වගන්තිය

ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් 44 වැනි වගන්තිය යටතේ විගණනයක දී හෝ 46 වැනි වගන්තිය යටතේ විභාගයකදී හෝ 47 වැනි වගන්තිය යටතේ පොත් පරීක්ෂා කිරීමකදී හෝ විමර්ශනයකදී හෝ ගණන් බේරා වසා දැමීමේදී ඒ සමිතිය සංවිධානය කිරීමෙහිලා හෝ එහි කළමනාකාරීත්වයෙහිලා සහභාගී වූ මේ ප්‍රඥප්තියෙහි හෝ වෙනත් පනතක විධි විධානවලට හෝ ඒ යටතේ සාදන රීති වලට හෝ නියෝග වලට නැතහොත් සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට හෝ කාරක රීති වලට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද මුදල් කාර්ය පරිපාටියට හෝ රෙජිස්ට්‍රාර්වරයා සමුපකාර සේවක කොමිෂන් සභාව හෝ විසින් නිකුත් කරන ලද යම් පොදු විධ විධානවලට පටහැනිව සමිතියේ අරමුදල් ප්‍රයෝජනයට ගත් යම් තැනැත්තකුගෙන් හෝ තැනැත්තන් කණ්ඩායමකින් හෝ ඒ සමිතියේ හිටපු හෝ දැනට සිටින යම් නිලධාරියෙකුගෙන් හෝ සේවකයකුගෙන් ඒ සමිතියට යම් මුදලක් හෝ අන් දේපලක් ලැබිය යුතු බව පෙනෙන අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි රෙජිස්ට්‍රාර් විසින් තමාගේ ඕනෑකම පිට හෝ සමිතියේ කාරක සභාවේ හෝ ඇවරකරුගේ හෝ යම් ණය හිමියකුගේ හෝ දායකයකුගේ ඉල්ලීම පිට ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන් කණ්ඩායමේ හෝ නිලධාරයන්ගේ හෝ සේවකයන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් පරීක්ෂා කර,

අ) ඒ මුදල හෝ එහි කොටසක් රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යයි අදහස් කරනු ලබන පොලියක් සමග ආපසු ගෙවන ලෙස :

ආ) ඒ අන් දේපල හෝ එහි කොටසක් ආපසු භාරදෙන ලෙස: හෝ

ඇ) සමිතියේ වත්කම්වලට රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවන ලෙස

ඔහුට හෝ ඒ කණ්ඩායමට නියම කරමින් නියෝගයක් කළ හැකිය. එවැනි යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට විරුද්ධව එබඳු යම් නියෝගයක් කිරීමට පෙර රෙජිස්ට්‍රාර් විසින් , ඒ නියෝගය නොකළ යුත්තේ මන්දැයි කරුණු කියා සිටීමට හා හේතු දැක්වීමට ඒ තැනැත්තාට හෝ තැනැත්තන් කණ්ඩායමට අවස්ථාවක් දිය යුතුය.

6. 1998 අංක 03 දරණ බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 68 වගන්තිය

ලියාපදිංචි කළ සමිතියක ගණන්, 44 වගන්තියේ විධි විධාන සලස්වා ඇති පරිදි විගණනය කරනු ලැබීමෙන් පසුව හෝ 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් පසුව හෝ, ලියාපදිංචි කළ සමිතියක පොත් පරීක්ෂා කර බැලීම සහ එහි කටයුතු විමර්ශනය කිරීම 47 වැනි වගන්තිය යටතේ කිරීමෙන් පසුව හෝ සමිතියේ නිලධරයකු හෝ සමාජිකයකු හෝ සේවකයකු වශයෙන් වූ තම තත්වයෙන් යම් මුදලක්, යම් බඩු හෝ දේපල භාරව සිටින හෝ යම් අවස්ථාවක භාරව සිටි නැතහොත්, ඒ මුදල්, බඩු හෝ දේපළ වල ආධිපත්‍ය ඇතිව සිටින හෝ යම් අවස්ථාවක ඇතිව සිටි හෝ තැන්ත්තෙකු විසින් ඒ නිලධරයා , සාමාජිකයා හෝ සේවකයා වශයෙන් තමා ළග තබාගෙන සිටින හෝ තමාගෙන් අයවිය යුතු බවට තමා විසින් තබන ලද හෝ අත්සන් කරන ලද හෝ අත්සන් කරන ලද ගණන් පොත් වල හෝ ප්‍රකාශවල පෙන්නුම් කෙරෙන යම් මුදලක් හෝ එහි ශේෂයන් ගෙවන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස හෝ එවැනි යම් බඩුවල හෝ දේපලවල වටිනාකම ගෙවන ලෙස හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල විය යුතුය. තව ද එසේ නියම කරනු ලැබීමෙන් පසු ඒ තැනැත්තා විසින් ඒ මුදල හෝ එහි ශේෂය හෝ වහාම ගෙවීම හෝ ඉදිරිපත් කිරීම හෝ එම බඩු වල හෝ දේපල වල වටිනාකම ගෙවීම හෝ යථා පරිදි ඒ සඳහා ගණන් ඉදිරිපත් කිරීම පැහැර හැරියහොත් ඔහු සාපරාධි විශ්වාසය කඩකිරීමේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු 10 ක් නොඉක්මවන කාලසීමාවට දෙයාකාරයෙන් එක් අකාරයක බන්ධනාගාර ගතකරනු ලැබීමට යටත්විය යුතුවාක් මෙන්ම දඩයකට ද ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්ම වූවද ඔහු යටත්විය යතුය.

7. 1998 අංක 03 දරණ බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 74 (1) සහ (2) වගන්තිය

74 (1) - රෙජිසට්‍රාර් විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් යථා පරිදි බලය පවරනු ලැබූ අන් තැනැත්තෙකු විසින් නියම කරන ලද , යම් ක්‍රියාවක් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම ඕනෑකමකින් පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ අකීකරු වන අසත්‍ය තොරතුරු සපයන හෝ අසත්‍ය දෑ ඉදිරිපත් කරන සෑම ලියාපදිංචි සමිතියක් හෝ එහි යම් නිලධාරයකු හෝ සේවකයකු හෝ සාමාජිකයකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදට වරදකරු විය යුතුය.

74 (2) - එවැනි වරදක් කරන සෑම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූවිට අවුරුදු දෙකක් නොයික්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දොලොස්දාහසක් නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දෙකටමහෝ ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්ම වූවද ඔහු යටත්විය යුතුය.

8. 1973 රීති මාලාවේ 24,37,39,40 දක්වා වගන්ති විධිවිධාන

රීති 24

ලියාපදිංචි කළ සමිතියක කාරක සභාව වෙත පැවරෙන වෙනත් කටයුතු කළ යුතු අතර පහත සඳහන් කටයුතුද කළ යුතු වේ.

රීති 24 (ආ)

සත්‍ය වූද නිවැරදිවූ ද ගණන් තැබීම;

රීති 24 (ඇ)

වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ගිණුම් තැබීම;

රීති 37

රෙජිස්ත්‍රාර්තුමා නියම කරන ලද ගණන් පොත්පත් හා වෙනත් ලියකියවිලි නිසි පරිදි තබා ගන්නා බවටත්,සමිතියේ ගිණුම් තැබීමට සුදුසුකම් ඇතිඅය සේවයට බඳවා ගන්නා බවටත්, සමිතියේ පොත්පත් නිසි පරිදි තබන බවටත්, සමිතියේ පොත්පත්හා ඒ ලියකියවිලි කලට වේලාවට ලියා තබන බවටත් වගබලා ගැනීම කාරක සභාව /අධ්‍යක්ෂක මණ්ඩලය සතු යුතු කමකි. එසේ නොකරන ලද කාරක සභාවක් / අධ්‍යක්ෂක මණ්ඩලයක් වරදකට වරදකරු වේ.

රීති 39

ලියාපදිංචි කරන ලද සෑම සමිතියකම කාරක සභාව කාරක සභාව විසින් පත් කරන ලද සමිතියේ නිලධාරියකු හෝ රෙජිස්ත්‍රාර්තුමා නියම කරන ආකාරයට සහ නියම කරන කාලයක් ඇතුළත ශේෂ පිරික්සුම (ආරම්භක මූල්‍ය තත්ව වාර්තාව), වෙළඳ හා වෙනත් ගිණුම් , ලාභඅලාභ ගිණුම් (ආදායම් ප්‍රකාශය ශේෂ පත්‍රය (මූල්‍ය තත්ව වාර්තාව ) රෙජිස්ත්‍රාර් වෙත ඉදිරිපත් කළයුතුය.

මේ අනුව සෑම ලියාපදිංචි සමුපකාර සමිතියක්ම ඉහත කී ප්‍රඥප්තියේ , රීති මාලාවේ , අතුරු ව්‍යවස්ථාවේ , සහ කාරක රීති විධිවිධාන අනුව , සමිති කටයුතු පවත්වා ගෙන යෑම, සමිති කටයුතු පරිපාලනය කිරිම, සමිති කටයුතු අඛණ්ඩ ඇගයීමත් කිරීමට හැකි වනු පිණිස තොරතුරු ඉදිරිපත් කිරිම සහතික කිරිමට සංවිධාන ක්‍රම, කාර්ය පටිපාටි, පොත් පත් නිසි පරිදි ගිණුම් තැබිම හා වාර්තා කලට වේලාවට ඉදිරිපත් කිරිම , සමිතියට අයත් මුදල් සහ දේපල වල ආරක්ෂාව සහතික කිරිම පිණිස සතුටුදායක කාර්ය පටිපාටි සකස් කොට තිබිම, සාමාජික හා සාමාජික නොවන ගණුදෙනුකරුවන්ගේ මුදල් වල ආරක්ෂාව සහතික කරනු වස් ශක්තිමත් ද්‍රවශීලතාවයක් පවත්වා ගෙන යාමට කටයුතු කිරිම.අරමුදල් ඵලදායිව ආයෝජනය කිරිම,කලට වේලාවට රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කල යුතු සත්‍ය වුත් නිවැරදි වුත් සියළුම ගිණුම් තොරතුරු හා පාලන වාර්තා ඉදිරිපත් කිරිම ,අවසන් ගිණුම් සකස් කර,කලට වේලාවට මූල්‍ය ප්‍රකාශන කට්ටල රෙජිස්ට්රාර්වරයා වෙත ඉදිරිපත් කර විගණනයට යොමු කර ගත යුතුය.

ඉහත කී නෛතික විධි විධාන වගන්ති වලින් අවධාරණය කර ඇති පරිදි කටයුතු කරන ලෙස සමිති/සංගම්,කාරක සභා/අධ්‍යක්ෂ මණ්ඩල සඳහා උපදෙස් දෙමි.එසේ ක්‍රියාකිරිම පැහැර හරින සමිති/සංගම්,කාරක සභාව/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් නිත්‍යානුකූල පරිදි කටයුතු කිරිමට සිදුවන බැව් අවධාරණය කරමු. ඒ සම්බන්ධව කටයුතු කිරිමේදි භාවිතා කරනු ලබන නෛතික ආකෘතිවල පිටපත්ද මීට අමුණා ඇත.

මේ අනුව ඉහත නෛතික ප්‍රතිපාදන අනුව සමිතියේ/සංගමයේ සෑම මුදල් වර්ෂයක් අවසන් වී මාස 03ක් ඉක්මවා යාමට පෙර අදාල මූල්‍ය ප්‍රකාශන අදාල දිස්ත්‍රික්කයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කල යුතු බව අවධාරණය කරමි.

එම්.ඒ.පී. ජයකොඩි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ත්‍රාර් (බ.ප)

පිටපත්

1. ප්‍රධාන ලේකම් (බ.ප) - කරු. දැ.පි
2. සමුපකාර අමාත්‍යාංශ ලේකම් (බ.ප) - කරු. දැ.පි
3. සමු.ස.සහකාර කොමසාරිස්(කොළඹ,ගම්පහ,කළුතර) -උක්ත චක්‍ර ලේඛනය පිළිබඳව සියළුම දෙපාර්තමේන්තු නිළධාරින් දැනුවත් කර සමිතිවල විගණන යාවත්කාලින කිරිම
4. සමු.ස. සහකාර කොමසාරිස් -විගණන (කොළඹ,ගම්පහ,කළුතර)- උක්ත චක්‍ර ලේඛනය පිළිබඳව සියළුම දෙපාර්තමේන්තු නිළධාරින් දැනුවත් කර සමිතිවල විගණන යාවත්කාලින කිරිම

o/c